# هدي النبي ﷺ

## للحفظ والوقاية من الشرور والأمراض والأوبئة

නපුරෙන් හා වසංගත රෝග වලින් ආරක්ෂා වීමට

# මුහම්මද් නබිතුමාගේ මඟ පෙන්වීම්

# කිහිපයක්

باللغة السنهالية




إعداد

**د. ناجي بن إبراهيم العرفج**

وفقه الله

ترجمة

**جمعية الدعوة والإرشاد**

**وتوعية الجاليات بالربوة**

නපුරෙන් හා වසංගත රෝග වලින් ආරක්ෂා වීමට

# මුහම්මද් නබිතුමාගේ මඟ පෙන්වීම් කිහිපයක්


## කර්තෘ :

**නාජී අල්අර්ෆජ්**

**සිංහල අනුවාදය :**
**මුහම්මද් අකීල් මුහම්මද් අමීන්**

**සෝදුපත් කියවීම :**
**නලීම් ඉස්සදීන්**

## අපරිමිත දයාන්විත අසම සම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

ශතවර්ෂ දහගතරකට පෙර සහ වර්තමාන නිවාරණ ඖෂධ වෛද්‍ය විද්‍යාව හඳුන්වාදීමට පෙර සිටම ඉස්ලාමයේ අවසාන දූතයා වන මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් විසින් සිය ශ්‍රේෂ්ඨ ජීවන මඟ හා අනාවැකිමය කියමන් තුළින් ව්‍යසනයකදී කටයුතු කළ යුතු ආකාරය අපට පෙන්වා දෙන ලදී. ඒවා සියල්ල දිව්‍යමය මඟ පෙන්වීම, දයාව, ආලෝකය සහ සුවය අඩංගු බව අල්ලාහ් විස්තර කරන මහිමාන්විත අල්කුර්ආනයට අනුකූල වේ. මෙම මඟ පෙන්වීම් සතුට හා සන්සුන් භාවය මෙන්ම COVID-19 වැනි නපුරු, වසංගත රෝග වලින් ආරක්ෂාව සහතික කරනු ඇත.

සනීපාරක්ෂාව, සුවය සහ සතුට සොයන්නන් කිසිදු ආදේශයක් නොමැති මැවුම්කරුවාණන් වූ ඒකීය දෙවියන් කෙරෙහි සැබෑ ලෙස විශ්වාස කොට, ඔහුට නැමදුම් කර අයැද සිටීම ඉතා උචිතය. මන්ද පාලනය, බලය, නියෝගය යනාදිය ඔහු සතුය. ඔහු සර්වබලධාරී ය. ඔහු සර්වපාලකයා ය. ඔහු සුව කරන්නා ය. ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

وإذا مَرِضتُ فَهُوَ يَشفِين

" **මා අසනීප වුවහොත් ඔහු (අල්ලාහ්) මා හට සුවය ලබා දෙන්නේය** "

قل لن يُصِيبَنَا إلّا مَا كَتَبَ اللهُ لنا هو مولانا وعلى اللهِ فليَتوكّل المُؤمِنُون

**අල්ලාහ් අපහට නියම කළ දෑ හැර වෙනත් කිසිවක් අපට සිදු නොවන්නේමය. ඔහු අපගේ භාරකරුය. තවද දේව විශ්වාසවන්තයින් අල්ලාහ් වෙතම (සියල්ල) භාර කළ යුතු යැයි (නබිවරය) නුඹ පවසනු. (09:51)**

මෙම ස්ථිර විශ්වාසයෙන්, අවංක ඒක දේවවාදය මෙන්ම ප්‍රතිලාභ, හානිය, ජීවනෝපාය ලබා දෙන සහ සදා ජීවමාන දෙවියන් කෙරෙහි පූර්ණ විශ්වාසය අප විසින් තහවුරු කරනු ඇත.

මුහම්මද් ﷺ තුමාණන්, දෙවියන් කෙරෙහි විශ්වාසය මත පමණක් එල්බ නොසිට භෞතික වස්තූන් උපයෝගී කර ප්‍රතිකාර කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අපට මඟ පෙන්වූ අතර එතුමා විසින් රෝග සහ වසංගත වලින් වැළකී ආරක්ෂාවෙන් සිටින ලෙසත්, අසනීප වූ විට ප්‍රතිකාර කරන ලෙසත් අපට අණ කරන ලදී.



එතුමාගේ සනීපාරක්ෂක ක්‍රම අතරින් යම් වසංගතයක් පැතිරෙන විට වර්තමානයේ “**සනීපාරක්ෂක හුදකලාව**” නොහොත් “**නිරෝධායනය**” ලෙස අප හඳුන්වන ක්‍රමයද අන්තර්ගත වීම පුදුමයට කරුණක් නොවේ. එලෙසම, දිවා රාත්‍රී පස්වේල් අනිවාර්ය සලාතය ඉටු කිරීමට පෙරත් අනෙකුත් වන්දනාවන් ඉටු කිරීමට පෙරත් අර්ධ දෝවනය හා පිරිසිදුභාවය අඛණ්ඩව පවත්වාගෙන යායුතු බව නබිතුමාණන් විසින් මුස්ලිම්වරුන්හට අණ කරන ලදී. මෙයද සනීපාරක්ෂක ක්‍රම අතරිනි. අත්, මුහුණ, මුඛය සහ නාසය සේදීම ඇතුළු ශරීරයේ සෙසු කොටස් සේදීම අර්ධ දෝවනයේ ඇතුළත් වේ. නිතර නිතර කරන මෙම සේදීමේ සහ පිරිසිදු කිරීමේ ක්‍රම මිනිස් සිරුරට ලෙඩ රෝග ගෙන එන හා වින කරන වෛරස් හා ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීමට උපකාරී වේ. කිවිසුම් යාමේදී මුඛය වසා ගන්නා ලෙසද එතුමාණන් අපට උපදෙස් ලබා දී ඇත.

වෛද්‍යවරුන් ඇතුළු ලෝක සෞඛ්‍ය සංවිධානය සහ අනෙකුත් රෝහල්, සෞඛ්‍ය හා වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශ අවධාරණය කරන හා නිර්දේශ කරන නිරෝධායනය , සෞඛ්‍ය උපදෙස් සහ රෝග වැළැක්වීමේ පූර්වාරක්ෂාවන්, පුද්ගලික සනීපාරක්ෂාව සහ අත් සේදීම වැනි සෞඛ්‍ය උපදෙස්, සියවස් ගණනාවකට පෙර මුහම්මද් නබිතුමාගේ නියෝග හා උපදෙස්වල සඳහන් විය.

වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා නබිතුමා පෙන්වා දුන් මඟ පෙන්වීම යටතේ නිරෝධායනය හා පිරිසිදුකමේ වැදගත්කම පහත සඳහන් මහාචාර්ය ක්‍රේග් කොන්සිඩයින්ගේ ප්‍රකාශය මඟින් සනාථ වේ.

මහාචාර්ය ක්‍රේග් කොන්සිඩයින්ගෙන් “වසංගතයක් තුළ සනීපාරක්ෂාව සහ නිරෝධායනය පිළිබඳ අගනා යෝජනාවක් ඉදිරිපත් කළේ කවුරුන්ද යනුවෙන් ඔබ දන්නවාදැයි විමසන ලදී. එවිට, ඔව් මා දනිමි. එය ආසන්න වශයෙන් මීට වසර 1,300 කට පෙර ඉස්ලාමයේ වක්තෘවරයා වූ “මුහම්මද්” වේ යනුවෙන් මහාචාර්යවරයා පවසා සිටියේය. මුහම්මද්තුමා කිසිසේත් මාරාන්තික රෝග පිළිබඳ විශේෂඥයෙකු නොවූවත්, COVID-19 වැනි වසංගතයක් වැළැක්වීමට සහ සටන් කිරීමට මුහම්මද්තුමා විසින් අගනා වෛද්‍ය උපදෙස් ඥානාන්විතව ඉදිරිපත් කරන ලදී .” (නිවුස්වීක් ඇමරිකානු සඟරාව)

එමෙන්ම නබිතුමාගේ පහත සඳහන් හදීස් ලැයිස්තුගත කරමින් මහාචාර්යවරයා මෙම ප්‍රකාශය නිකුත් කරන ලදී. මුහම්මද් නබි තුමාණෝ මේ අයුරින් අවවාද කර ඇත.





(إذا سمعتم بالطاعون بأرض فلا تدخلوها ، وإذا وقع بأرض وأنتم بها فلا تخرجوا منها)

**යම් ප්‍රදේශයක වසංගතයක් පැතිරී යන බව ආරංචි වූ විට ඔබ ඒ නගරයට ඇතුල් නොවන්න. තවද වසංගතය පවතින නගරයෙන් පිටත් වී තවත් නගරයකට ද ඇතුල් නොවන්න. (සහීහ් බුහාරී)**

قال صلى الله عليه وسلم: (لا يُورِدُ مُمرِضٌ على مُصِح)

**නබිතුමා විසින් ප්‍රකාශ කරන ලදී: අසනීප වූවෙකු නිරෝගී කෙනෙකු වෙත රැගෙන නොයා යුතුයි. (සහිහ් මුස්ලිම්)**

قال صلى الله عليه وسلم: (الطهور شطر الإيمان)

**නබිතුමා විසින් ප්‍රකාශ කරන ලදී: පිරිසිදුකම දේව විශ්වාසයේ අඩකි. (සහීහ් මුස්ලිම්)**

මහාචාර්යවරයා විසින් නබිතුමාගේ මෙම ප්‍රකාශය ද උපුටා දක්වන ලදී:

قالت الأعراب يا رسولَ الله ألا نتداوى قال نعم يا عبادِ الله تداوَوا، فإن اللهَ لم يضع داءً إلا وضع له شِفاء –أو دواء– إلا داءً واحدا، فقالوا: يا رَسول الله وما هو؟ قال: الهَرَمُ

**වරක් සමහර ගම්බද අරාබිවරු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතුදැයි නබිතුමාගෙන් විමසූ අතර එයට පිළිතුරු දෙමින්, අහෝ අල්ලාහ්ගේ දාසයිනි! වෛද්‍ය ප්‍රතිකාර වලින් ප්‍රයෝජන ගන්න. මක්නිසාදයත්, අල්ලාහ් යම් රෝගයක් ඇති කළේ නම් ඒ සඳහා පිළියමක් නියම කරන්නේමය. එක් රෝගයක් හැර. එය කුමක්ද යනුවෙන් විමසන ලදී. එවිට වයසට යෑම වේ යනුවෙන් නබිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. (සහිහ් අබූ දාවූද්)**

මහාචාර්යවරයාගේ ප්‍රකාශය අවසන්. සඟරාවේ පළ වූ ලිපිය කියවීමට https://www.newsweek.com/prophet-prayer-muhammad-covid-19-coronavirus-1492798 මෙම සබැඳියෙන් පිවිසෙන්න.

අවශ්‍යාජ, පූර්ව සාධක සහිත හදීස් වල සඳහන් නබි තුමාණන් වදාළ ප්‍රාර්ථනාවන් කිහිපයක් පහත සඳහන් වේ. මැවුම්කරුවාණන් වෙත නැඹුරුවීම, දේව විශ්වාස තුළ ස්ථිරභාවය සහ අල්ලාහ්ගේ ආරක්ෂාව සහ ඔහුගේ බලය කෙරෙහි වූ නිශ්චිතභාවය තමන් තුළ රැකගැනීම යන කොන්දේසි යටතේ සහ අල්ලාහ්ගේ අභිමතයට අනුව, එම ප්‍රාර්ථනාවන් මිනිසකුට ආරක්ෂාව හිමි කර දෙන ආධ්‍යාත්මික හේතු වේ. සැබැවින්ම සුවය, නිරෝගීකම සහ ආරක්ෂාව මෙන්ම හේතුඵල සියල්ල ද අල්ලාහ් සතුය.

قال صلى الله عليه وسلم: (مَنْ قَرَأَ بِالآيَتَيْنِ مِنْ آخِرِ سُورَةِ الْبَقَرَةِ فِي لَيْلَةٍ كَفَتَاهُ)

**නබිතුමාණන් මෙසේ වදාලහඃ කවරෙකු බකරා නමැති පරිච්ඡේදයේ අවසන් වැකි දෙක රාත්‍රියෙහි පාරායනා කරන්නේද ඒ දෙක ඔහුට ප්‍රමාණවත් වේ. (සහීහ් බුහාරි)**

قال صلى الله عليه وسلم: (قل: "قُلْ هُوَ اللَّهُ أَحَدٌ وَالْمُعَوِّذَتَيْنِ حِينَ تُمْسِي وَتُصْبِحُ ثَلَاثَ مَرَّاتٍ؛ تَكْفِيكَ مِنْ كُلِّ شَيْءٍ") حديث صحيح، رواه أبو داود

**නබිතුමාණන් මෙසේ වදාලහඃ ඔබ උදය සහ සවස් වරුවේ (කුල් හුවල්ලාහු අහද් නමැති පරිච්ඡේදය හා මුඅව්විදතයින් නොහොත් කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින් නාස් නමැති පරිච්ඡේද, තෙවරක් පාරායනා කරන්න. සියල්ලෙන් ආරක්ෂා වීමට ඒවා ඔබට ප්‍රමාණවත්ය. (සහීහ් අබූ දාවූද්)**

إذا أويت إلى فراشك، فاقرأ آية الكرسي: الله لا إله إلا هو الحي القيوم . حتى تختم الآية، فإنك لن يزال عليك من الله حافظ، ولا يقربك شيطان حتى تصبح

**නබිතුමාණන් මෙසේ වදාල බව අබූ හුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරයිඃ ඔබ නින්දට යන විට ආයතුල් කුර්සිය මුල සිට අල්ලාහු ලාඉලාහ ඉල්ලාහුවල් හයියුල් කයියූම් යනුවෙන් ආරම්භ කර අග දක්වා කියවන්න. මෙය පාරායනය කරමින් සිටිනා විට අල්ලාහ්ගෙන් වූ ආරක්ෂකයකු ඔබත් සමඟ නොකඩවා සිටියි. අලුයම කාලය දක්වා ෂයිතාන් ඔබට ලං වෙන්නේ නැත. (සහීහ් බුහාරි)**

මෙම හදීසය හැර තවත් බොහෝ හදීස් වල ආයතුල් කුර්සි පාරායනය කිරීමේ මහිමය පිළිබඳ සඳහන් වී ඇත.

قال رسول الله صلى الله عليه وسلم: (مَا مِنْ عَبْدٍ يَقُولُ فِي صَبَاحِ كُلِّ يَوْمٍ وَمَسَاءِ كُلِّ لَيْلَةٍ: بِسْمِ اللَّهِ الَّذِي لَا يَضُرُّ مَعَ اسْمِهِ شَيْءٌ فِي الْأَرْضِ وَلَا فِي السَّمَاءِ وَهُوَ السَّمِيعُ الْعَلِيمُ - ثَلَاثَ مَرَّاتٍ - فَيَضُرُّهُ شَيْءٌ

**නබිතුමාණන් මෙසේ වදාලහඃ සෑම දිනකම උදේ හා සවස් වරුවේ කවරෙකු (බිස්මිල්ලා හිල්ලදී ලා යළුර්රු මඅ ඉස්මිහී ශෛයිඋන් ෆිල් අර්ළි වලා ෆිස් සමාඉ වහුවස් සමීඋල් අලීම්) යනුවෙන් තෙවරක් පවසන්නේද එදින කිසිදු හානියක් ඔහුට සිදු නොවේ. (තිර්මිදි)**

තේරුමඃ පොළොවෙ හි හෝ අහසෙ හි හෝ ඔහුගේ නාමය සමග කිසිම වස්තුවකට ගැටිය නොහැකි (අනතුරක් කළ නොහැකි) වූ අල්ලාහ්ගේ නාමයෙන් ආරක්ෂාව පතමි. ඔහු සියල්ල අසන්නාය. සියල්ල දන්නාය.

وكان رسول الله ﷺ لا يدع هؤلاء الدّعوات حين يمسي وحين يصبح اللَّهُمَّ إِنِّي أَسْأَلُكَ الْعَافِيَةَ فِي الدُّنْيَا وَالْآخِرَةِ، اللَّهُمَّ إِنِّي أَسْأَلُكَ الْعَفْوَ وَالْعَافِيَةَ فِى دِينِي وَدُنْيَايَ وَأَهْلِي وَمَالِي، اللَّهُمَّ اسْتُرْ عَوْرَاتِي، وَآمِنْ رَوْعَاتِي، اللَّهُمَّ احْفَظْنِي مِنْ بَيْنِ يَدَيَّ وَمِنْ خَلْفِي وَعَنْ يَمِينِي وَعَنْ شِمَالِي وَمِنْ فَوْقِي وَأَعُوذُ بِعَظَمَتِكَ أَنْ أُغْتَالَ مِنْ تَحْتِي) . حديث صحيح، رواه ابن حبان

**නබිතුමාණන් නොකඩවා උදේ හවස මෙසේ ප්‍රාර්ථනා කරනු ඇතඃ අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ආෆියත ෆිද් දුන්යා වල්ආහිරා අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් අෆ්ව වල් ආෆියත ෆී දීනී වදුන්යාය වඅහ්ලී වමාලී අල්ලාහුම්මස්තුර් අව්රාතී වආමින් රව්ආතී අල්ලාහුම්මහ් ඉහ්ෆල්නී මින් බයිනි යදයිය වමින් කල්ෆි වමින් යමීනී, වමින් ෂිමාලී වමින් ෆව්කී ව අඌදු බි අළමතික අන් උග්තාල මින් තහ්තී. (සහීහ් ඉබ්නු හිබ්බාන්)**

තේරුම: යා අල්ලාහ්! මොලොව හා පරලොව නිරෝගීභාවය ඔබෙන් පතමි! යා අල්ලාහ්! මගේ ආගම මගේ ලෞකික ජීවිතය මගේ පවුල හා මගේ සැප සම්පත් වලට ඔබේ සමාව ද යහපත ද අයැද සිටිමි! යා අල්ලාහ්! මගේ අඩුපාඩු වසං කරනු මැනව! මගේ බිය තුරන් කරනු මැනව! මගේ ඉදිරිපස, පසුපස, දකුණු පස, වම්පස, ඉහළ හා පහළ යන පැතිකඩ වලින් ආරක්ෂාව සලසනු මැනව! මට පහළින් විය හැකි අනතුරු ඔබේ ශ්‍රේෂ්ඨත්වයෙන් මඟ හරවනු මැනව!

මෙම ආයාචනාවන් හා ප්‍රාර්ථනාවන් මඟින් සර්වබලධාරී දෙවියන්ගේ අවසරය ඇතිව සෑම ආපදාවකින් ම සම්පූර්ණ ආරක්ෂාවක් හිමි වේ.

قال صلى الله عليه وسلم: (اللَّهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنَ الْبَرَصِ وَالْجُنُونِ وَالْجُذَامِ وَمِنْ سَيِّئِ الْأَسْقَامِ)

**නබිතුමාණන් මෙසේ වදාලහඃ අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් බරසි වල් ජුනූනි වල් ජුදාම් වමින්සයියිඉල් අ z ස්කාම්. (සහීහ් අබූ දාවූද්)**

තේරුම: අහෝ අල්ලාහ්! ලාදුරු, උමතුබව, බරවා (වැනි රෝගවලින්) සහ වෙනත් නපුරු රෝග වලින් මම ඔබගෙන් රැකවරණය පතමි.

අතීතයේ සිදු වූ වර්තමානයේ හා අනාගතයේ සිදු විය හැකි අයහපත් තත්ත්වයන්, ලෙඩරෝග, වසංගතයන්, පීඩාවන් හා මානසික ආබාධ යන කාරණා වලින් දෙවියන්ගෙන් ආරක්ෂාව අයැද සිටීම මෙම පුළුල් ප්‍රාර්ථනාව තුළ අඩංගු වේ.





قالِ صلى الله عليهِ وسلم: (إذا خرجَ الرَّجُلُ من بَيتِه، فقال: باسمِ الله، تَوكَّلتُ على الله، لا حَولَ ولا قُوّةَ إلَّا بالله،
يُقالُ له: هُديتَ، وكُفيتَ، ووُقيتَ، فتتنحّى عنه الشَّياطينُ، فيقولُ شَيطانٌ آخرُ: كيفَ لك برَجُلٍ قد هُدِيَ وكُفِيَ
ووُقِيَ؟) . حديث صحيح، رواه أبو داود

**නබිතුමාණන් මෙසේ වදාලහ: කවරෙකු තම නිවසින් බැහැර යන විට (බිස්මිල්ලාහ්, තවක්කල්තු අලල්ලාහ්, ලා හවුල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්) යනුවෙන් පවසයිද, ඔබට නිවැරදි මඟ හිමි විය, ඔබට ප්‍රමාණවත් විය, ඔබට ආරක්ෂාව හිමි විය (යැයි සුර දූතයකු හරහා) කියනු ලැබේ. තවද ඔහුගෙන් ෂෙයිතාන් දුරස් ව යනු ඇත. එක් ෂෙයිතාන්වරයෙකු තවත් ෂෙයිතාන්වරයෙකු බලා මෙසේ කියනු ඇත: ඔබට නිවැරදි මඟ හිමි විය, ඔබට ප්‍රමාණවත් විය, ඔබට ආරක්ෂාව හිමි විය යැයි කියනු ලැබූ කෙනෙකුට නුඹට කුමක් නම් කළ හැකිද? (සහීහ් අබූ දාවූද්)**

තේරුම: අල්ලාහ්ගේ නාමයෙන් පිටව යමි. ඔහු මත ම විශ්වාසය තැබුවෙමි. ඔහු හරහා මිස යම් හෙයකින් ආරක්ෂා වීමට ශක්තියක් හෝ හැකියාවක් හෝ නැත.

قال صلى الله عليه وسلم: ( من قال في دُبرِ صلاةِ الفجرِ وهو ثانٍ رجليه قَبلَ أن يتكلَّمَ: لا إِلَهَ إلَّا اللَّهُ، وحدَهُ لا
شريكَ لَهُ، لَهُ الملكُ ولَهُ الحمدُ، يُحيي ويُميتُ وَهوَ على كلِّ شيءٍ قديرٌ عشرَ مرَّاتٍ كتَبَ اللَّهُ له عشرَ حسناتٍ،
ومَحا عنهُ عشرَ سيئاتٍ، ورفَعَ له عشرَ درجاتٍ، وكانَ يومَه ذلك كله في حرزٍ من كلِّ مكروهٍ وحُرِسَ منَ
الشَّيطانِ) . حديث صحيح، رواه الترمذي

**නබිතුමාණන් මෙසේ වදාලහ: සෑම ෆජ්ර් සලාතයකටම පසු, දෙපා නවාගනිමින් අසුන් ගෙන, යම් කථාවක නිරත වීමට පෙර කෙනෙකු (ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු යුහ්යී වයුමීත් වහුව අලා කුල්ලි ෂයින් කදීර්) යනුවෙන් දස වතාවක් පවසන්නේද අල්ලාහ් ඔහුට කුසල් දහයක් ලියා, අකුසල් දහයක් මකා දමනු ඇත. තවද ඔහුට උසස්වීම් දහයක් ලබා දෙනු ඇත. එදින සෑම විපතකින් ම ඔහුට ආරක්ෂාව හිමි වන අතර ෂයිතාන්ගේ උවදුරු වලින් ඔහුට ආරක්ෂාව ලැබේ. (තිර්මිදි)**





وعن عائشة رضي الله عنها ، كان النبي صَلَّى اللهُ عليه وسلَّمَ إذا أوَى إلى فِراشِهِ كُلَّ لَيْلَةٍ جمع كَفَّيْهِ، ثُمَّ نَفَثَ فِيهما فَقَرَأَ فِيهما : ” قُلْ هو اللَّهُ أحَدٌ وقُلْ أعُوذُ برَبِّ الفَلَقِ وقُلْ أعُوذُ برَبِّ النَّاس، ثُمَّ يَمْسَحُ بهِما ما اسْتَطاعَ مِن جَسَدِهِ، يَبْدَأُ بهِما علَى رَأْسِهِ ووَجْهِهِ وما أقْبَلَ مِن جَسَدِهِ يَفْعَلُ ذلكَ ثَلاثَ مَرَّاتٍ“ . حديث صحيح، رواه البخاري

**ආඉෂා (රළි) තුමිය මෙසේ වාර්තා කර ඇත. නබිතුමාණන් සෑම රාත්‍රියකම නිදියහනට පැමිණ ඉනික්බිතිව දෙඅත්ල එකට එකතු කොට කුල් හුවල්ලාහු අහද්, කුල් අඌදු බිරබ්බිල් ෆලක්, කුල් අඌදු බිරබ්බින් නාස් යන පරිච්ඡේද තුන පාරායනය කිරීමෙන් පසු ඒ දෙඅත්ල තුළ පිඹ සිය ශරීරයෙන් ස්පර්ෂ කළ හැකි ස්ථාන වලට ඒ දෙඅත්ල ගෙන යමින් පිරිමදිනු ඇත. ප්‍රථමයෙන් හිස හා මුහුණ පිරිමැද පසුව සිය ශරීරයේ ඉදිරිපස පිරිමදිනු ඇත. මේ අයුරින් තුන් වරක් සිදු කරයි. (බුහාරි)**

රෝග නිවාරණ වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ මුහම්මද් නබිතුමාගේ ජීවන රටාව තුළ විශාල මග පෙන්වීම් සහ විශිෂ්ට මාර්ගෝපදේශ අපට දැක ගන්නට පුළුවණි. රෝගීන්, තුවාල ලැබුවන් සහ සත්ත්වයින් විසින් සපා කෑමට ලක් වූ අයවලුන් සඳහා සූරතුල් ෆාතිහාව පාරායනය කිරීම හරහා මැතිරීම් කර සුවය පැතීමට නබිතුමාණන් සිය මිතුරන් වන සහාබාවරුන්ට අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා යම් උදාහරණ කිහිපයක් පහත සඳහන් වේ.

وجاء في قصة رقية اللديغ: ( قال أبو سَعيدٍ رضي الله عنه: فأتَيتُه فقَرَأْتُ عليه فاتحةَ الكِتابِ؛ فأفاقَ وبرَأَ . . . حتى أتَيْنا رسولَ اللهِ فأخبَرتُه الخَبَرَ، فقال: وما يُدريكَ أنَّها رُقْيةٌ؟ ) . حديث صحيح، رواه أبو داود

**සතෙකු විසින් සපා කෑමට ලක් වූ පුද්ගලයකු පිළබඳ අබූ සර්දි තුමාණන් මෙසේ පවසයි: ඔහු වෙත මා පැමිණ අල් - ෆාතිහා (අල්කුර්ආනයේ පළමුවන පරිච්ඡේදය) කියවා මැතිරීම් කළෙමි. ඔහු අවදි වී සුවය ලැබීය. නබි තුමාණන් වෙත අප පැමිණි කල්හි ඒ පුවත පිළිබඳ දන්වා සිටියෙමි. එය රුක්‍යාහ් නොහොත් මැතිරීමක් බව ඔබ දැනගත්තේ කෙසේද ? යනුවෙන් පවසා ඒ ක්‍රියාව අනුමත කළේය. (සහීහ් අබූ දාවුද්)**

එවැනි මගපෙන්වීම් අතුරින් නබිතුමාගේ ගෞරවණීය මිතුරකු වන උස්මාන් (රළි) තුමාණන් වාර්තා කරන මෙම ප්‍රකාශය ද එකකි.

عن عثمان بن أبي العاص رضي الله عنه أنه شكا إلى رسول الله صلى الله عليه وسلم وجعا يجده في جسده، فقال له رسول الله صلى الله عليه وسلم: ضع يدك على الذي يألم من جسدك وقل: بسم الله ثلاثا، وقل سبع مرات: أعوذ بعزة الله وقدرته من شر ما أجد وأحاذر . قال: ففعلت، فأذهب الله ما كان بي حديث صحيح، رواه مسلم

**එතුමාණන් නබිතුමාණන් වෙත සිය ශරීරයේ ඇති වූ වේදනාවක් පිළිබඳ පවසන ලදී. එවිට නබිතුමාණන් මෙසේ ඔහුට කියා දුන්හ. ඔබ ඔබේ අත ශරීරයේ වේදනාව ඇති වන ස්ථානය මත තබා (බිස්මිල්ලාහ්) යනුවෙන් තුන් වරක් පවසන්න. පසුව (අඌදු බිඉzස්z සතිල්ලාහි වකුද්රතිහී මින් ෂර්රි මා අජිදු වඋහාදිර්) යනුවෙන් හත්වතාවක් පවසන්න. උස්මාන් (රළි) තුමාණන් මෙසේ පවසයි: මා ඒ අයුරින් කළෙමි. මාගේ වේදනාවන් පහවී ගියේය. (මුස්ලිම්)**

මෙම ප්‍රාර්ථනාවේ තේරුම : අල්ලාහ්ගේ ශක්තියෙන් හා ගෞරවයෙන් මා බිය වන හා මා හට ඇති වන දැහි නපුරෙන් ආරක්ෂාව පතමි.

وجاء رجلٌ إلى النَّبيِّ – صلَّى اللهُ عليه وسلَّم – فقال: يا رسولَ الله، ما لقِيتُ من عقربٍ لدغتني البارحةَ . فقال له رسولُ الله صلى الله عليه وسلَّمَ: أما إنَّك لو قلتَ حين أمسيت: أعوذ بكلماتِ اللهِ التَّامَّاتِ من شرِّ ما خلق لم تضُرَّك . حديث صحيح، رواه مسلم

**නබිතුමාණන් වෙත පුද්ගලයකු පැමිණ අහෝ අල්ලාහ්ගේ දූතයාණෙනි! පෙරදින රාත්‍රියේ ගෝනුස්සෙකු මා දෂ්ඨ කළේය. එවිට නබිතුමාණන් ඔබ සවස් කාලයේදී අඌදු බිකලිමාතිල්ලාහිත්තාම්මාති මින් ෂර්රි මා (ක)හලක් යනුවෙන් පැවසුවේ නම් ඔබට කිසිදු හානියක් සිදු නොවේ යනුවෙන් ප්‍රකාශ කරන ලදී. (මුස්ලිම්)**

මෙම ප්‍රාර්ථනාවේ තේරුම: අල්ලාහ්ගේ සම්පූර්ණ වූ වදන් තුළින් ඔහුගේ මැවීම් වලින් සිදු විය හැකි හානි වලින් මා ආරක්ෂාව පතමි.

وعن عائشة رضي الله عنها، كان النبيُّ صَلَّى اللهُ عليهِ وسلَّمَ يُعَوِّذُ بَعْضَ أَهْلِه، يَمْسَحُ بيَدِهِ اليُمْنَى ويقولُ: ( اللَّهُمَّ رَبَّ النَّاسِ أَذْهِبِ البَاسَ، اشْفِهِ وأَنْتَ الشَّافِي، لا شِفَاءَ إلَّا شِفَاؤُكَ، شِفَاءً لا يُغَادِرُ سَقَمًا ) . حديث صحيح، رواه البخاري

**ආඉෂා (රළි) තුමිය මෙසේ වාර්තා කරයි: නබිතුමාණන් සිය පවුලේ ඇතැම් ඥාතීන් වෙනුවෙන් ආරක්ෂාව පතා (අල්ලාහුම්ම රබ්බන්නාසි, අද්හිබිල් බඃස, ඉෂ්ෆිහී වඅන්තෂ් ෂාෆී, ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක, ෂිෆාඅන් ලා යුගාදිරු සක්මා) යනුවෙන් ප්‍රාර්ථනා කර සිය දකුණතින් ඔවුන්ව පිරිමදියි. (බුහාරී)**

මෙම ප්‍රාර්ථනාවේ තේරුම: අහෝ අල්ලාහ්! ජනතාවගේ ස්වාමීනි! කරදරය ඉවත් කර මෙම රෝගියා සුව කරන්න. ඔබ සුව කරන්නා ය. ඔබේ සුවය මිස වෙන කිසිම සුවයක් නැත. කිසිදු වේදනාවක් ඉතිරි නොවන සුව කිරීමකින් සුවය ලබා දෙන්න.

සාබිත්තුමාණන් අබූ හම්ˆසාතුමාණන් අමතා මා හට වේදනාවක් දැනෙනු ඇත යනුවෙන් පවසා සිටියේය. මා ඔබට නබිතුමාණන් කළ මැතිරීමකින් මැතිරීමක් කරන්නද යනුවෙන් විමසා : අල්ලාහුම්ම රබ්බන්නාසි, අද්හිබිල් බ:ස, ඉෂ්ෆිහී වඅන්තෂ් ෂාෆී, ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක, ෂිෆාඅන් ලා යුගාදිරු සක්මා – යනුවෙන් පාරායනා කළහ. (බුහාරි)





# خاتمة

## අවසන් වදන් පෙළ

සැබෑ විශ්වාසවන්තයා විසින් එකම මැවුම්කරු වූ දෙවියන් සියලු අයහපත් තත්ත්වයන් වලින් සහ ලෙඩරෝග, වසංගතයන් වලින් ආරක්ෂා කරන්නා බව තරයේ විශ්වාස කරනු ලැබේ. එමෙන්ම ලෙඩරෝග, වසංගතයන් සහ මානසික අවපීඩනයෙන් සුවය, ආරක්ෂාව සලසා ගැනීම සඳහා අප සැවොම දෙවියන් කෙරෙහි විශ්වාසය තැබිය යුතු අතර පසුතැවිලි වීම, සමාව අයැදීම, දෙවියන් කෙරෙහි නැඹුරු වීම සහ මුහම්මද් නබිතුමාගේ මග පෙන්වීම අනුගමනය කිරීම හා එතුමාට පහළ වූ (උතුම් අල්කුර්ආනය) අනුගමනය කිරීම යනාදී කරුණු සමග අප සැවොම බැඳී සිටිය යුතුයි. ශුද්ධ වූ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත.

وَلَقَدْ أَرْسَلْنَا إِلَىٰ أُمَمٍ مِّن قَبْلِكَ فَأَخَذْنَاهُم بِالْبَأْسَاءِ وَالضَّرَّاءِ لَعَلَّهُمْ يَتَضَرَّعُونَ

**තවද සැබැවින්ම අපි නුඹට පෙර වූ සමූහයන් වෙත ද දූත පණිවිඩ එව්වෙමු. ඔවුන් (පාපිත වූ බැවින්) යටහත් පහත් විය හැකි වනු පිණිස දුෂ්කරතාවන් හා පීඩාවන්ගෙන් ඔවුන් ව හසු කළෙමු. (අල් අන්ආම්: 42)**

وَاسْتَغْفِرُوا رَبَّكُمْ ثُمَّ تُوبُوا إِلَيْهِ إِنَّ رَبِّي رَحِيمٌ وَدُودٌ

**නුඹලාගේ පරමාධිපතිගෙන් නුඹලා සමාව අයැද සිටිනු. පසු ව ඔහු වෙත පශ්චාත්තාප වී නැවත යොමු වනු. නියත වශයෙන්ම මාගේ පරමාධිපති අපරිමිත දයාන්විතය. සෙනෙහෙවන්තය. (හූද්: 90)**

وتوبوا إلى الله جميعا أيها المؤمنون لعلكم تفلحون

**අහෝ දෙවියන් කෙරෙහි විශ්වාස තැබූවනි! නුඹලා ජය ලැබිය හැකි වනු පිණිස නුඹලා සියල්ල පශ්චාත්තාප වී අල්ලාහ් වෙත නැඹුරු වනු. (අන්නූර්: 31)**





## دُعَاء

# අපේ ප්‍රාර්ථනාව

اللَّهُمَّ احفَظنَا وأَحبابِنَا والمُسلِمِينَ والنَّاس أَجمَعِينِ مِن كُلِ وَبَاءٍ وَبَلاءٍ

**අහෝ අල්ලාහ්! අප හා අපගේ ආදරණීයයන්, මුස්ලිම්වරුන් ඇතුළු ලෝ වාසී සියළු ජනයා නපුරු වසංගත හා පීඩාවන්ගෙන් ආරක්ෂා කර දෙනු මැනව!**





جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة

هاتف: ٠١١٤٤٥٤٩٠٠ - للتواصل: ٠٥٦٩٣٧٤٩٨٦

OFFICERABWAH